## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමන ධාරිතා ගොඩ නැංවීමේ ව්‍යාපෘතිය - 2011

---

1. **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක තැන්පතුව, විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණ බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 24,032,018 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 29,893,731 ක් විය. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පසුගිය මාස 08 ක කාල

පරිච්ඡේදය සඳහා වූ වියදමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ වියදම් සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2011 වර්ෂය සඳහා වියදම් | 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස අටක කාලපරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උපදේශක සේවා | 21,097,012 | 4,486,646 | 25,583,658 |
| භාණ්ඩ හා උපකරණ | - | 1,375,067 | 1,375,067 |
| පුහුණු හා වැඩමුළු | 2,935,006 | - | 2,935,006 |
| එකතුව | 24,032,018 | 5,861,713 | 29,893,731 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූලාශ්‍ර ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා එම දිනට ගිණුමේ ඇති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 55,000 | 6,102,437 |
| එකතු කළා: ඌන පූර්ණයන් | 177,661 | 19,539,373 |
| විදේශ විනිමය හුවමාරු ලාභය | - | 314,250 |
| | 232,661 | 25,956,060 |
| අඩු කළා : | | |
| ආපසු ගැනීම් | (230,000) | (25,653,012) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,661 | 303,048 |

## 3. විගණන නිරීක්ෂණ

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) විගණනයට ඉදිරිපත්කරන ලද ගිණුම් සහ ගෙවීම් වවුචර්වල දක්වන පුහුණු හා වැඩමුළු වියදම් අතර රු. 288,676 ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස සසඳා ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ii) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බැංකු ගිණුමක රු. 1,620,993 ක මුදලක් 2011 දෙසැම්බර් 31 දිනට උපයෝජනයකින් තොරව පවතින බව ගිණුම්වල දක්වා තිබුණි. කෙසේ වුවද මෙය එදිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණු අතර මේ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) එක්සත් රාජධානියෙන් ප්‍රකාශන ප්‍රසම්පාදනය කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංවිධානය වෙත පෙර වර්ෂයේදී ගෙවා තිබුණු රු. 3,321,245 කින් රු. 1,946,178 ක් වටිනා ප්‍රකාශන ව්‍යාපෘතිය වෙත ලැබී නොතිබුණු අතර මෙම මුදල 2011 ඔක්තෝබර් 21 දින ආපසු ලබා දී තිබුණි. මේ අතර නොලැබුණු භාණ්ඩ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ප්‍රතිපාදනයක් කර තිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ගෙවීම් වවුචර්, ඉන්වොයිසි, කුවිතාන්සි, උපදේශක විසින් ඉදිරිපත් කරන ලද අවසන් වාර්තා සඳහා අනුමැතිය හා අනෙකුත් සම්බන්ධිත උපයෝගී ලියකියවිලි නොමැති වීම හේතුවෙන් උපදේශකවරුන්ට හා සැපයුම් කරුවන්ට ගෙවන ලද එකතුව රු. 26,958,725 ක් වූ ඍජු ගෙවීම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 3.3 ප්‍රදාන ගිවිසුමට අනුකූල නොවීම

----------------------------------

ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.03 වගන්තිය අනුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කර ඇගයීමට ලක්කළ යුතු අතර ඒ පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසානයේ පිළියෙල කළ යුතුය. කෙසේ වුවත්, ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය හා පෙර කාල පරිච්ඡේදය සඳහා එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 3.4 සැලසුම් කිරීම හා අධීක්ෂණය

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ නිශ්චිත කාලය තුළ ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම උදෙසා මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව අපේක්ෂා කරන මූල්‍ය හා භෞතික ඉලක්කයන් සඳහන් කරමින් ව්‍යාපෘතියේ සම්පූර්ණ කාල පරිච්ඡේදයම ආවරණය වන පරිදි විස්තරාත්මක සමස්ථ සැලසුමක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, එවැනි සැලසුමක් ව්‍යාපෘතිය මගින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ඉහත පරිදි සැලසුමක් ඉදිරිපත් කිරීමට ව්‍යාපෘතිය එකඟවී තිබුණු නමුත් 2012 මැයි 31 දින දක්වාත් එය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ ප්‍රධානීන් විසින් ඉටු කරගත යුතු ඉලක්කයන් සමඟ වගකීම් හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සිදු කළ යුතු කාර්යයන්ට අදාල අයවැයගත වෙන් කිරීම් පැහැදිළිව හඳුනා ගත හැකි වන පරිදි වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණුවලට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් හා නිවැරදි ක්‍රියාමාර්ගයන් ගැනීමෙන් ව්‍යාපෘතියේ සමසථ ප්‍රගතිය නියමිත පරිදි ඇගයීම් කළ නොහැකි විය.

මේ පිළිබඳව මාගේ පෙර වර්ෂයේ වාර්තාව මගින් ව්‍යාපෘතියේ කළමනාකාරීත්වයේ අවධානයට යොමුකර තිබුණු නමුත් 2012 මැයි 31 දින දක්වා නිවැරදි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

## 3.5 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා වෙන්කරන ලද රු. 52,854,276 (එ.ජ. ඩොලර් 472,634) ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 29,893,731 (එ.ජ. ඩොලර් 267,316) ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.6 කාර්ය සාධන සමාලෝචනය

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති පරිදි ගිවිසුමේ සංරචක 01 හා 02 යටතේ සඳහන් ශ්‍රීලං.වි.ස.නි.කො.ස. වේ කාර්ය මණ්ඩලය සහ උනන්දුවක් දක්වන පාර්ශවයන් පුහුණු කිරීම් හා වැඩමුළු පැවැත්වීම වෙනුවෙන් රු. 10,059,763 (එ.ජ. ඩොලර් 88,320) ක මුදලක් වෙන් කර දී තිබුණු නමුත් ශ්‍රීලං.වි.ස.නි.කො.ස. වේ නිලධාරීන් 05 දෙනෙකු සඳහා විදේශ පුහුණුව

ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 3,223,683 (එ.ජ. ඩොලර් 25,768) ක වියදමක් පමණක් දරා තිබුණි.

(අ) ව්‍යාපෘතියේ නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී අරමුණු ඉටුකර ගැනීම සඳහා 2012 මාර්තු 31 දක්වා කිසිදු වැඩමුළුවක් පවත්වා නොතිබුණි.

(ඇ) පුළුල් සැලසුමක් නොමැති වීමෙන් 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගයීම් කළ නොහැකි විය. මේ හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනට අපේක්ෂිත ඉලක්කයන් ඉටුකර ගැනීමට ව්‍යාපෘතියට හැකිවේ දැයි යන්න සැක සහිතය.